# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 අප්‍රේල් / මැයි**

**සමාජීය විද්‍යා පීඨය**

**මනෝවිද්‍යාව - PSYC - E 1015**

**මනෝවිද්‍යාවට හැඳින්වීමක්**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ''මානව ස්වභාවය අධ්‍යයනය කිරීම පොදු අරමුණ කරගත් වෙනත් විෂයයන් හා මනෝවිද්‍යාව අතර පවතින්නේ සමීප සම්බන්ධතාවයකි.'' මනෝවිද්‍යාව හා ඔබ කැමති වෙනත් ඕනෑම විෂයන් හතරක් අතර පවත්නා අන්තර් සම්බන්ධතාව ඇසුරෙන් ඉහත ප්‍රකාශයෙහි සප්‍රමාණතාව විමසන්න.

02. මනෝවිද්‍යාවෙහි උප විෂය ක්ෂේත්‍ර තුනක් ඇසුරෙන් එම විෂයෙහි අධ්‍යයන ක්ෂේත්‍රය විශ්ලේෂණය කරන්න.

03. ඇන්ටන් මෙස්මර්, පියරි ජෙනට් හා ජෝසෆ් බෲවර් විසින් නූතන මනෝවිද්‍යාවෙහි වර්ධනයට ලබා දුන් දායකත්වය කෙටියෙන් විස්තර කරන්න.

04. එක්කෝ පැව්ලෝව් නැතහොත් තෝන්ඩයික් හෝ ස්කිනර් විසින් කරනු ලැබූ පර්යේෂණ හා එයින් ගම්‍ය වන මූලධර්ම ඇසුරෙන් චර්යාවාදී මනෝවිද්‍යාව පිළිබඳ රචනාවක් ලියන්න.

05. 'ප්‍රජානන' සංකල්පය හඳුන්වා දෙමින් ප්‍රජානන ඉගෙනුමට අදාළ මූලික සංකල්ප විස්තර කරන්න.

06. එක්කෝ ඒබ්‍රහම් මාස්ලෝගේ නැතහොත් කාල් රොජර්ස්ගේ ඉගැන්වීම් ඇසුරෙන් මානුෂවාදී හා සංදෘෂ්ටිකවාදී මනෝවිද්‍යාවේ ප්‍රමුඛ මූලධර්ම විභාග කරන්න.

07. සම්ප්‍රදායික හා නූතන සමාජ සාධක පුද්ගලයා ප්‍රේරණය කිරීමට බලපාන ආකාරය වෙන වෙනම පෙන්වා දෙන්න.

08. බහුවිධ බුද්ධිය යනු කවරේද? නූතන අධ්‍යාපනයෙහි හා වෘත්තීය ක්ෂේත්‍රයෙහි ලා එයට හිමි වැදගත්කම පරීක්ෂා කරන්න.

09. නූතන සමාජ සන්දර්භයෙහි, චිත්තවේග 'පුපුරවා හැරීමට' වඩා ඒවා කළමනාකරණය කිරීම අවශ්‍ය වෙන්නේ ඇයි?

10. 'ආත්ම සංකල්පය' (self) යනු කවරේද? ආත්ම සංකල්පයෙහි ව්‍යාකූලතා- පුද්ගලයෙකුගේ මානසික සෞඛ්‍යයට කෙසේ තර්ජනයක් වේ ද?

**පැවරුම් නිබන්ධය - ''සමාජ සංකීර්ණත්වය හා පුද්ගල මානසික සෞඛ්‍යය''**

****************